ජයතිලක
කම්මැල්ලවීර



# මෛත්‍රීගේ මෛත්‍රිය
## දරාගත නොහැකි සමාජයක්



දශක ගණනාවක් තිස්සේ සමාජ-දේශපාලන-ආර්ථික-සදාචාර යනාදී සෑම අතකින්ම පිරිහෙමින් තිබූ අපේ ශ්‍රී ලාංකික සමාජය මහින්ද රාජපක්ෂගේ පාලනය තුළ ඒ පරිහානිය වේගවත්වෙමින්, ගැඹුරුවෙමින් අගාධයේ මුවවිටට ලඟාවිය. රට අපරාධවලින් ගහන විය. දූෂණය හා නාස්තිය රාජ්‍යයේ විවෘත මුහුණුවර විය. හොරුන් වාචාලයන්, දේශහිතෛශීන් වූ අතර යුක්තිය සාධාරණය සමානත්මතාව ගැන කතාකරන්නා දේශද්‍රෝහියකු විය. යුද්ධය අවසන් වූ පසු රජපවුලට මුළුරටම භුක්තියට පවරා දෙමින් ඒ පවුලට ආවතේවකිරීම සහ ආවැඩීම පාර්ලිමේන්තුවේත්, අධිකරණයේත්, ජනමාධ්‍යයේත්, රාජ්‍ය අයතනවලත් එකම රාජ කාර්‍යය බවට පත්වෙමින් රටවැසියෝ අතවැසියන් බවට පත්වූහ. ආගමික නායකයින් සේ ම උගතුන් සහ කලාකරුවන්ගෙන් අති බහුතරය ඒ යටත්වැසියන් අතරද සිටියේ පසුපෙළේය. රජ පවුලේ අයට සේ ම නෑයින්ට හිතමිතුරන්ට වන්දිභට්ටයන්ට, රාජ්‍ය සම්පත් හිතුමතේ පරිහරණය කරන්නට, කෝටි ගණනින් කොමිස් ගහන්නට, පමණක් නොව ඕනෑම අපරාධයක් කර නීතියෙන් ගැලවී සිටින්නට වරප්‍රසාද තිබුණු අතර පොලිසියේද වෙනත් රාජ්‍ය ආයතනවලද නිලධාරීන්ටද රජපවුලේ ඇත්තන්ට සහ හිතවතුන්ට උදව්කරමින් තමන්ටද හරිහම්බ කර ගැනීමේ නිදහස ලැබී තිබිණ. ඒ අතර රජු මිත්‍යාවේ සංකේතය වූයෙන් ඔහුගේ මිත්‍යා ඇදහිලි සියල්ල සමාජය පුරා ව්‍යාප්ත කිරීමේ කාර්යය මාධ්‍ය ඔස්සේ කදිමට ක්‍රියාත්මක වූයෙන් රටේ බහුතරයක් මිත්‍යා අන්ධකාරයේ ගිලී සිටියහ. රටේ සුළුජාතීන් රටවැසියන් ලෙස නොසැළකිණ. ඒ අනුව මහින්ද රාජපක්ෂ පාලනය යටතේ අප ජීවත්වූයේ මුළුමනින්ම විකෘති සමාජයකය.

2015 ජනවාරි 8 වෙනිද මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති බවට පත්වන්නේ එම විකෘති සමාජයේ  මිස ප්‍රජාතන්ත්‍රවාදී ඇවතුම් පැවතුම් හුරුකම් ඇති සමාජයක නොවේ. දැන් රට තුළ සිදුවෙමින් පවතින දේ තේරුම් ගැනීමට නම් මේ අවබෝධය අත්‍යවශ්‍යය. ඒ අවබෝධයෙන් බලන්නේ නම් දින සියයේ වැඩසටහනේ ප්‍රමාදයන් සහ අඩුපාඩුවලට හේතු කාරණා තේරුම් ගත හැකි වෙයි.

දින සියසේ වැඩසටහන රට හමුවේ තැබූ අයගෙන් කෙනෙකු වූ රාජිත සේනාරත්න මහතා 2015 - 02- 26 වෙනිදින මාධ්‍ය හමුවේ කළ ප්‍රකාශයක් මෙහි ලා ඉතා වැදගත් වෙයි. 'ආණ්ඩුව මාරු වුනාට තවම තියෙන්නේ පරණ රාජ්‍යය ම යි. ඒක වැඩ කරන්නේ ආණ්ඩුව ගැන මහජනයා කලකිරවන්නයි. මහාපරිමාණ හොරුන්ට නිදහසේ ඉන්න දීල අල්ලන්නෙ ශෂීල රදලියගොඩලා අල්ලල තේරුමක් නෑ.'

මෙහි අදහස නම් රාජ්‍ය සහ ආණ්ඩුව කියන්නේ එකක් නොව දෙකක් බවයි. රාජපක්ෂ යුගයේ මෙය දෙකක් නොව එකක් හැටියට ක්‍රියාත්මක වූ බව අපි දුටුවෙමු. එසේ වූයේ මහින්ද විධායකයේ බලය උපරිම ලෙස වර්ධනය කර ගනිමින් එය උපරිම ලෙස යොදා ගත් බැවිනි. දැන් රාජ්‍ය තමන්ට ඕනෑ හැටියට ක්‍රියාත්මක කරවන්නට නම් මෛත්‍රී ද කළ යුතු වන්නේ විධායක බලය උපරිම ලෙස යොදා ගැනීමයි. දශක ගණනාවක් එසේ ඒකාධිපති විධායක බලයට හුරු වී සිටි සමාජයක් ප්‍රජාතන්ත්‍රවාදී නිදහසට හුරුකරවීම දින සියයකින් හෝ දින සියයක වැඩසටහනකින් කළ හැක්කක් නොවේ. මෛත්‍රීගේ මෛත්‍රිය අපේ සමාජයට දරා ගැනීම අපහසුය. සමස්ත සමාජය පසෙක තබමු. තමා සභාපති වී සිටින පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමට පවා එය දරා ගැනීමට බැරි බව දැන් ඒ කණ්ඩායමේ අය කෙළින පිස්සුවලින් හොඳහැටි ඔප්පු වෙයි. ඔවුන්ගෙන් සමහරු සෘජුවද සමහරු වක්‍රව ද මහින්දව ම ඉල්ලා සිටීමේ තේරුම එයයි.  මෛත්‍රීපාල ජනාධිපතිවරණයෙන් ජයගත් පසුවද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා මහින්ද යයි ඔවුහු මාධ්‍ය සාකච්ඡාවල කීහ. පක්ෂය දියවෙන්නට පටන් ගත් විට ඔවුන් මෛත්‍රීට එහි සභාපතිකම පිරිනමා ඒ දියවීම තාවකාලිකව වළක්වා ගත් නමුත්

තමා පත්ව සිටින්නේ අසීමිත විධායක බලය සහිත ජනාධිපතිවරයා හැටියට වුවද රටට පොරොන්දු වූයේ විධායක බලය අත්හරින්නට බව නිතර සිහිතබාගෙන සිටින නිසාදෝ පත්වූ ද සිටම මෛත්‍රී හැසිරෙන්නේ විධායක බලය නැති ගානටය.

මහින්ද අත්හැරියේ නැත. පක්ෂයේ අනුශාසක තනතුරක් දී ඔහු ඉහළින් තබා ගත්හ. ඊළගට ඔවුන් කීවේ ආණ්ඩුවේ කොටස්කාරයන් වෙන්නට නම් ඇමති මණ්ඩලය 100ක් දක්වා වැඩිකළ යුතුබවයි. ඒ කියන්නේ මහජන මුදල් කොතරම් කාබාසිනියා වේද යන්න නොසලකා මහින්ද ක්‍රියා කළ අන්දමට ක්‍රියා කළ යුතු බව හැර වෙනත් දෙයක් නොවේ. දින සියයයේ වැඩසටහනට අපි සම්පූර්ණ සහයෝගය දෙනවා කියා මෛත්‍රී පක්ෂ සභාපති පුටුවේ වාඩිකරවා ගත් මොවුන් දැන් කියන්නේ කුමක්ද? ජනාධිපති විධායක බලය ඉවත් කෙරෙන ව්‍යවස්ථා සංශෝධනයට සහයෝගය නොදෙන බවයි.

මෛත්‍රී ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපත් දේශපාලන සදාචාරයක් වෙනුවෙන් කැප වී සිටින බව  මාස එකහමාරක කාලය තුළ ඉතා හොඳින් පෙන්වා තිබේ. ඔහු ආරම්භ කළේ 'මම රජෙක් නොවෙයි. මම ජනතාවගේ ප්‍රධාන සේවකයායි' කියමිනි. ඒ අනුව තමා ඇමතීමට අතිගරු, උතුමානන් යනාදී යෙදුම් නොයෙදිය යුතු බව ඔහු රටට කීවේය. එය 'මහරජානනී' යයි තමා ඉදිරියේ ගයන විට පස්වනක් ප්‍රීතියෙන් උදම්වූ රාජපක්ෂට සපුරා වෙනස් වෘතයකි. ඒ සේ ම ඔහු චාම් ව හැසිරෙයි. නළු වෙස් ගෙන බොරු තරුණකම් හා චන්ඩිකම් නොපෙන්වයි. වහසි බස් නොදෙඩයි. තමාට අවමන් කළවුන්ගෙන්වත් පළිගන්නට නොපෙළඹෙයි. ඔහුගේ මේ චාම්බව, සරලබව සහ නිහතමානීකම ඉහත කී පරිහානිගත සමාජයේ බහුතරයකට දුර්වලකමක්, නිවටකමක් ලෙස පෙනෙන්නට ද බැරි නැත. විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමේ සමහරු එසේ සලකා හැසිරෙන බවකි පෙනෙන්නේ. එසේ නොමැති නම් ජනාධිපතිවරයා තම නායකයා යයි කියන අතරම ඔහු රටට දුන් ලොකුම පොරොන්දුවට විරුද්ධ යයි කියන්නේ කෙසේද?

තමා පත්ව සිටින්නේ අසීමිත විධායක බලය සහිත ජනාධිපතිවරයා හැටියට වුවද රටට පොරොන්දු වූයේ විධායක බලය අත්හරින්නට බව නිතර සිහිතබාගෙන සිටින නිසාදෝ පත්වූ ද සිටම මෛත්‍රී හැසිරෙන්නේ විධායක බලය නැති ගානටය. ඔහු, තමා රට හමුවේ පොරොන්දු වූ පරිදි රනිල් වික්‍රමසිංහ මහතා අගමැති හැටියට පත් කර ඔහුගේ කැමැත්තට අනුව කැබිනට් මණ්ඩලයක් පත්කරගෙන ආණ්ඩුව කරගෙන යන්නට ඉඩ දී උපේක්ෂාවෙන් බලා හිඳී. තමාට බාරදුන් පක්ෂ නායකත්වය බාරගෙන පක්ෂයේ මන්ත්‍රීවරුන් කරන කියන දෑ පිළිබඳවද ඒ උපේක්ෂාවෙන්ම බලා සිටින බවකි පෙනෙන්නේ. පරාජිත රාජපක්ෂ තවත් වටයකින් බලය ඩැහැගන්නට කැසකවමින් සිටින බව පෙනිපෙනී උපේක්ෂාවෙන් බලාහිඳී. රාජපක්ෂලා තම සේවයට හීලෑකර හදාගත් පොලීසිය, අල්ලස් කොමිසම ඇතුළු රාජ්‍ය ආයතන පුරුදු පාරේම යන බවක් පෙනෙද්දී පවා මෛත්‍රීගේ උපේක්ෂාව නොබිඳෙන බවකි පෙනෙන්නේ.

දීර්ඝ කාලයක් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ සමාජයකට නම් මේ උපේක්ෂාව දරා ගන්නට පුළුවන. එහෙත් මෙහි මුලින් සඳහන් කළ පරිදි සෑම අතකින්ම පරිහානියේ අගාධය මුව විට සිටින සමාජයක මේ උපේක්ෂාව බරපතළ අනතුරක් මතුකරන බව සඳහන් කිරීම අත්‍යවශ්‍යය.

රාජපක්ෂ පවුල සහ ඔහුගේ හිතවතුන් රටේ සම්පත් කෝටි ප්‍රකෝටි ගණනින් ගසා කෑ බව, කෝටි ප්‍රකෝටි ගණන් මහජන මුදල් හිතාමතාම නාස්ති කළ බව ලෝකයම දන්නා සත්‍යයකි. එහෙත් මෛත්‍රී පාලනය යටතේ ඔවුන් තවමත් නිරුපද්‍රිතව සිටිනවා පමණක් නොව රටට සුදුසුම පාලකයා මහින්ද රාජපක්ෂ බවට ජනමතයක් ගොඩනගන්නට ද නිදහස ලැබී තිබේ. එම පරිසරය ගොඩනැගී ඇත්තේ 2010 ජනාධිපතිවරණය අවසන් වූ මොහොතේම සරත් පොන්සේකා සම්බන්ධයෙන් රාජපක්ෂලා ක්‍රියා කළ ආකාරයට මෛත්‍රී ක්‍රියා නොකළ බැවිනි. ජනාධිපතිවරණ ප්‍රචාරක වේදිකාවල මෛත්‍රීට ඉතාම පහත් ලෙස නින්දා අපහාස කළේ විමල් වීරවංශයි. ඔහුගේ බිරිය බොරු උප්පැන්න ඇතුළු ව්‍යාජ ලියකියවිලි මගින් රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍ර ලබාගෙන ඇති බව පැහැදිලිවම පෙනෙද්දීත් ඇය රුපියල් 15000/ක් වැනි සුළු ඇපයක් මත  නිදහස ලබන්නේ මෛත්‍රී, රාජපක්ෂලා මෙන් ක්‍රියා නොකරන නිසාය. 43වැනි අගවිනිසුරුවරිය රාජපක්ෂලාට අවශ්‍ය පරිදි ක්‍රියා නොකරන අවස්ථාවකට පත් වූ විට ඇයට විරුද්ධව චෝදනා පිට චෝදනා හදමින් ඇයට ඇති බැංකු ගිණුම් ගණන හුවා දක්වමින් වැඩිපුරම කෑ ගැසූ පුද්ගලයා වූයේ විමල් වීරවංශය. දැන් හෙළිවී ඇති තොරතුරුවලට අනුව ඔහුගේ බිරියට ද බැංකු ගිණුම් විස්සක් පමණ තිබුණු බව පෙනේ. ඒ සේ ම ව්‍යාජ ලියවිලි මගින් ලබාගත් ගමන් බලපත්‍ර යොදාගෙන එකම රටට දෙතුන්වර යමින් ඇය කිසියම් ව්‍යාපාර කටයුත්තක යෙදී ඇති බවද පෙනේ. කළුසල්ලි සුදුකරන තැනක් බවට ප්‍රසිද්ධ සීෂෙල්ස්වලට ද ඇය රාජපක්ෂලා සමග ගොස් ඇතැයි කියති. රාජපක්ෂ ආණ්ඩුවේ ඇමතිවරන් කිහිප දෙනෙකුටම ඩුබායිහි ගෙවල් සහ වෙළඳ ව්‍යාපාරද  සීෂෙල්ස්වල බැංකු ගිණුම්ද  ඇති බව පසුගිය කාලයේ කියැවිණ. ඒ සේ ම රාජපක්ෂ ආණ්ඩුවේ ඇමතිවරයකු වූ පසු විමල් වීරවංශ කෝටිපතියකු වූ බවද වාර්තා වී තිබේ. ඒ අනුව රාජපක්ෂලාගේ පළිගැනීමේ විධික්‍රම යොදා ගන්නේ නම් ශෂී වීරවංශ පරීක්ෂණ තව බොහෝ පැතිවලට ගෙන යා හැකිව තිබේ. එහෙත් පොලීසිය යන දුරක් යන්නට ඉඩදී මෛත්‍රී නිහඬව සිටින්නේ ඔහු ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි තබන බලාපොරොත්තු නිසා විය යුතුය. වෙලේ සුදාගෙන්  හෙළිදරව් වූ කුඩු රජවරු සම්බන්ධයෙන්ද ඔහු පොලීසියේ ඔතෑනි පිළිවෙතට ඉඩදී බලාසිටින්නේ විධායක බලය කිසිවකටවත් පාවිච්චි නොකරන්නෙමැයි අධිශ්ඨානයෙන් සිටින නිසා විය යුතුය.

එහෙත් තීරණාත්මක දේ වෙනුවෙන් තරමක් හෝ තදින් නොසිටියහොත් අසීමිත රජබලයට කාලයක් තිස්සේ හුරු වී සිටි සාමාන්‍ය ජනයා බොහෝ ඉක්මණින් කළකිරීමට පත් වන්නට ඉඩ ඇති බවත් එසේ සිදු වුවහොත් අනතුර ඇත්තේ මෛත්‍රීට පමණක් නොව යහපත් රටක් ගොඩනගා ගැනීමට මහත් ප්‍රාර්ථනා සහිතව කැපවූ ජනතාවට බවත් අවධාරණය කළ යුතුව ඇත. එහෙයින් රාජ්‍ය යන්ත්‍රයත් පක්ෂයත් ඔබ අපේක්ෂා කරන ප්‍රජාතන්ත්‍රවාදී ගමනට හැඩගස්වා ගැනීම වෙනුවෙන් තරමක් තදින් සිටින්නැයි අපි අපේ ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටිමු.